රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක: 290.

රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 7.
1985 මැයි 20 වන දින.

අමාත්‍යාංශ ලේකම්වරුන්,
දෙපාර්තමේන්තු ප්‍රධානීන්,
රාජ්‍ය සංස්ථා සහ රජයේ ආධාර ලබන
ආයතනවල සභාපතිවරුන්.

## රාජ්‍ය හා සංස්ථා අංශයේ සේවා නියුක්තිය පිළිබඳ සංගණනය - 1985.

රාජ්‍ය හා සංස්ථා අංශයේ සේවා නියුක්තිය පිළිබඳ සංගණනයක් 1985 පැවැත්වීමට ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව (ජ.සං.දෙ.) විධිවිධාන සලසා ඇත. මෙය රාජ්‍ය හා සංස්ථා අංශයේ සේවා නියුක්තිය පිළිබඳව පවත්වන සංගණන මාලාවේ පස්වැන්නයි. රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය විසින් ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ සහාය ඇතිව මෙවැනිම සංගණන 1968, 1972 සහ 1976 වසරවල පැවැත්වූ අතර, මෙහි සිවුවැන්න 1980 වසරේදී ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව පැවැත්වූයේය.

2. 1985 රාජ්‍ය හා සංස්ථා අංශයේ සේවා නියුක්තිය පිළිබඳ සංගණනය 1985 ජූලි මස 02 වැනි දිනට පැවැත්වීමට නියමිතව ඇත. මෙම සංගණනයට රජයේ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, රාජ්‍ය සංස්ථා සහ රජයේ ආධාර ලබන ආයතනවල සියළුම ස්ථිර, තාවකාලීන හා අනියම් සේවකයින් ඇතුලත් විය යුතුය. ඉල්ලා ඇති තොරතුරු සේවා නියුක්තිකයින් සැපයිය යුතු අතර ඒවා ඔවුන් විසින්ම ගණන් ගැනීමේ ආකෘති පත්‍රයේ සඳහන් කළ යුතුය.

3. ගණන් ගැනීමේ ආකෘතිපත් ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව ඔබ වෙත සපයනු ඇත. ආයතනයේ සියළුම සේවකයනට ආකෘති පත්‍ර බෙදා දීම, සම්පූර්ණ කරන ලද ආකෘති පත් ආපසු ලබා ගැනීම සහ ඒවායේ පරිපූර්ණත්වය හා නිරවද්‍යතාවය පරීක්ෂා කොට බලා හැකි ඉක්මනින් ඒවා ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව වෙත එවීමත් අත්‍යවශ්‍යය.

4. රාජ්‍ය අංශයේ සේවා නියුක්තිය පිළිබඳව තත්කාලීන දත්ත හා තොරතුරු ලබා ගැනීමෙහිලා අවශ්‍යව ඇති එම සංගණනයේ වැදගත්කම මවිසින් තව දුරටත් අවධාරණයෙන් කිවයුතු නොවේ. 3 වන ඡේදයේ විස්තර කොට ඇති වැඩ කටයුතු හොඳින් ඉටු කරන බව තහවුරු වන පරිදි අවශ්‍ය විධිවිධාන සලස්වන මෙන් මා ඉතා ඕනෑකමින් ඉල්ලා සිටිමි. සංගණනයේ සාර්ථකත්වය සඳහා ඔබගේ සහයෝගය බලාපොරොත්තු වෙමි.

Siriwardhana

ඩී.බී.අයි.පී.එස්.සිරිවර්ධන
ලේකම්.
රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය.

පිටපත්:- 1. අධ්‍යක්ෂ - ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව.
2. ලේකම් - සැළසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යාංශය.